# දෙවිඳුන්ගෙන් ඔබ වෙත පිදෙන ආත්මීය සන්දේශයකි

## මාගේ දරුව...

ඔබ මා ගැන සමහර විට දන්නේ නැතිව ඇති, ඒත් මම ඔබව හොඳින් අඳුනනවා. *ගීතාවලිය 139:1*

ඔබ ඉඳ ගන්න විට, නැගිටින විට මම දන්නවා. *ගීතාවලිය 139:2*

ඔබගේ සෑම වැඩක්ම මට හුරු පුරුදුයි. *ගීතාවලිය 139:3*

ඔබගේ හිස කෙස් පවා මම ගැන තිබෙනවා. *මතෙව් 10:29-31*

ඒ ඔබව මාගේ ස්වරූපයෙන් සෑදුව නිසයි. *උත්පත්ති 1:27*

ඔබ ජීවත් වෙන්නේ, ක්‍රියා කරන්නේ, ඔබගේ පැවැත්ම රැඳෙන්නේ මා තුළයි. *ක්‍රියා 17:28*

මව් කුසට ඔබ එන්නත් කලින් මම ඔබව දැන සිටියා. *යෙරමියා 1:4-5*

ඒ ඔබ මගේ දරුවා නිසයි. *ක්‍රියා 17:28*

මම ඔබව තෝරාගත්තේ මැවිල්ල සැලසුම් කළ මොහොතේදියි. *එපීස 1:11-12*

මගේ පොතේ ඔබගේ සෑම දවසක්ම ලියා තිබෙන නිසා ඔබ අත්වැරදීමක ප්‍රතිඵලයක් නොවේ. *ගීතාවලිය 139:15-16*

ඔබ ඉපදෙන නියම වෙලාව සහ ඔබ ජීවත් වෙන්න ඕන තැන තීරණය කළේ මමයි. *ක්‍රියා 17:26*

අසීමිත ගෞරවයෙන් ඔබව සෑදුවා. *ගීතාවලිය 139:14*

අම්මාගේ කුසයේදී ඔබව සෑදුවේ මමයි. *ගීතාවලිය 139:13*

ඔබ ඉපදුන දවසේ ඔබව ලෝකයට ගෙනාවේ මමයි. *ගීතාවලිය 71:6*

මාව නාඳුණන අය මා ගැන වැරදියට විස්තර කළා. *යොහන් 8:41-44*

මම ඈත් වෙලාවත්, තරහ වෙලාවත් නැහැ. ආදරයේ සම්පූර්ණ සළකුණ මමයි. *1 යොහන් 4:16*

ඉතින් මාගේ ආශාව ඔබ මත මගේ ආදරය වගුරවන්නයි. *1 යොහන් 3:1*

ඒ ඔබ මගේ දරුවා වීමත් මම ඔබගේ තාත්තා වීමත් නිසයි. *1 යොහන් 3:1*

ඔබගේ භූමියේ තාත්තාට කිසිදාක දෙන්න බැරි සෑම දෙයක්ම මට දෙන්න පුළුවන්. *මතෙව් 7:11*

ඒ මා පරිපූර්ණ තාත්තා නිසාය. *මතෙව් 5:48*

ඔබට ලැබෙන සෑම සුන්දර තෑග්ගක්ම ලැබෙන්නේ මගෙන්ය. *යාකොබ් 1:17*

ඒ, මා ඔබගේ ගෙදර මූලිකයා නිසා මම ඔයාට අවශ්‍ය සෑම දෙයක්ම ලබා දෙන නිසයි. *මතෙව් 6:31-33*

ඔබගේ අනාගතය සඳහා මගේ සැලැස්ම සෑමවිටම බලාපොරොත්තුවෙන් පිරිලා තිබෙනවා. *යෙරමියා 29:11*

ඒ ඔබට තියෙන මගේ ආදරය සදාකාලික නිසයි. *යෙරමියා 31:3*

ඔබ වෙනුවෙන් මගේ පැතුම් මුහුදු වෙරළේ වැලි මෙන්ම ගණන් කරන්න බැහැ. *ගීතාවලිය 139:17-18*

ඒ වගේම මම ගී ගයමින් ඔබ ගැන සතුටු වෙනවා. *ශෙපනියා 3:17*

ඔබට යහපත් දේ කිරීමට කිසි දවසක මම පැකිලෙන්නේ නැහැ. *යෙරමියා 32:40*

ඒ ඔබ මගේ අනර්ඝ වස්තුව නිසයි. *නික්මයාම 19:5*

මගේ ආශාව මගේ මුළු හදවතින් සහ ආත්මයෙන් ඔබව ගොඩනැගීමයි. *යෙරමියා 32:41*

මට අවශ්‍ය ඔබට බලවත්, විශ්මිත දේ පෙන්වීමටයි. *යෙරමියා 33:3*

ඔබගේ මුළු හදවතින් මාව සෙව්වොතින් ඔබට මාව සම්බවේවි. *ද්වීතිය කථාව 4:29*

මා තුළ සතුටු වී ඔබගේ හදවතේ ආශාවන් ඉෂ්ඨ කරගන්න. *ගීතාවලිය 37:4*

ඔබට ඒ ආශාවන් දුන්නේ මමයි. *පිලිප්පි 2:13*

ඔබ වෙනුවෙන් හුගක් දේ කරන්න මට පුළුවන්. *එපීස 3:20*

ඒ මම ඔබගේ බලවත්ම දිරිදෙන්නා නිසයි. *2 තෙසලෝනික 2:16-17*

ඒ වගේම ඔබගේ සෑම ප්‍රශ්නයකදීම ඔබව සනසන තාත්තා මමයි. *2 කොරින්ති 1:3-4*

ඔබගේ හිත බිඳී සිටින විට මම ඔබ ළග ඉන්නවා. *ගීතාවලිය 34:18*

මම ඔබව මගේ හදවතට තුරුළු කරගෙන යන්නේ එඬේරෙක් බැටළු පැටවා ගෙන යනවා වගේ. *යෙසායා 40:11*

යම් දවසක ඔබගේ ඇස්වල සෑම කඳුළක්ම මම පිස දමනවා. *එළිදරව්ව 21:3-4*

ඒ වාගේම ඔබ මේ ලෝකේ වින්ද සෑම වේදනාවක්ම මම අයින් කරනවා. *එළිදරව්ව 21:3-4*

මම ඔබගේ තාත්තා නිසා මම ඔබට ආදරය කරන්නේ මගේ පුතා යේසුස්ට වගේමයි. *යොහන් 17:23*

යේසුස් තුළින් මම මගේ ආදරය ඔබට එළි කරනවා. *යොහන් 17:26*

මගේ නියම ස්වරූපයේ නියෝජිතයා උන්වහන්සේය. *හෙබෙව් 1:3*

උන්වහන්සේ ආවේ මා ඔබට ලැදි බවත් විරුද්ධ නැති බවත් පෙන්වන්නයි. *රෝම 8:31*

ඒ වාගේම මම ඔබගේ පව් ගණන් නොකරන බවත් කියන්නයි. *2 කොරින්ති 5:18-19*

යේසුස් මැරුණේ ඔබත් මමත් සමාදාන කරන්නයි. *2 කොරින්ති 5:18-19*

උන්වහන්සේගේ මරණය ඔබට මම දක්වන ආදරයේ අවසාන සළකුණයි. *1 යොහන් 4:10*

ඔබගේ ආදරය ලබාගන්න, මම ආදරය කළ සෑමදේම මම පූජා කළා. *රෝම 8:31-32*

තෑග්ගක් ලෙස ඔබ මගේ පුතා යේසුස් ලබාගත්තොත්, ඔබට මාව ලැබෙනවා. *1 යොහන් 2:23*

ඊට පස්සේ කිසිම දෙයකට ඔබව මගේ ආදරයෙන් වෙන් කරන්න බැහැ. *රෝම 8:38-39*

ගෙදර එන්න, එවිට මම ස්වර්ගයේ මේතාක් නොදුටු උත්කර්ෂවත්ම උත්සවය පවත්වන්නම්. *ලූක් 15:7*

මම සෑම විටම ඔබගේ තාත්තා නිසා, සදාකාලෙටමත් තාත්තා වෙනවා. *එපීස 3:14-15*

මාගේ ප්‍රශ්නය නම්... ඔබ මාගේ දරුවා වෙනවාද? *යොහන් 1:12-13*

මම ඔබ එනතුරු බලා ඉන්නවා. *ලූක් 15:11-32*

*ඔබගේ ආදරණීය තාත්තා*

*මහෝත්තම දෙවියන්වහන්සේ*